DOI: 10.31357/fhssmst.2011.00058

# සබරගමුවේ වතු ද්‍රවිඩ ජනතාවගේ ජන නාට්‍ය

# කාමන් කූත්තු

කොළොන්න ගමරාළලාගේ ප්‍රියංකා කුමුදුනී

24 OCT 2011

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ

ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා

සිංහල විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධය.

## උපාධි අපේක්ෂකයාගේ ප්‍රකාශය

මෙම නිබන්ධයේ අන්තර්ගතය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනිල් ආරියරත්න මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මෙම පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

2011 . 10 . 20

දිනය

කේ. පී. ප්‍රියංකා කුමුදුනී

පරීක්ෂක මණ්ඩලය විසින් නිර්දේශිත සියලු නිවැරදි කිරීම්, එකතු කිරීම් සහ සංශෝධනය කිරීම් උපාධි අපේක්ෂිකාව විසින් අවසාන නිබන්ධයේදී සිදුකර ඇති බව මෙයින් සහතික කරමු.

---------------------------------------- ----------------------------------------

අත්සන අත්සන

24/10/11 24/10/2011

---------------------------------------- ----------------------------------------

දිනය දිනය

උපදේශක අංශ ප්‍රධාන

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මහාචාර්ය

සුනිල් ආරියරත්න මහතා ගංගානාත් දිසානායක මහතා

**Senior Professor**
**SUNIL ARIYARATNE**
**B. A. (Hons), Ph. D (Sri Jayewardenepura)**
**Sangit Visharad (Lucknow),**
**Certificate in Tamil (Madras)**

## පූජනය

පැමිණි දුක් පැණි රසයි
තනි සිතට උහුළලා
සිනාවෙන් පිරී වතින්
නැගී කඳුළු සඟවලා

තනුව වී මගෙ දිවිය
සෙනෙහසින් පුරවලා
නැණ පහන් දල්වන්න
සතුට උගසට කළා

නුඹවන් අම්මාවරුන්ගේ නිම නොවන සෙනෙහසට !

# පටුන


*ඡායාරූපාවලිය* *iv*

*උපකාරානුස්මෘති* *vi*

*නිබන්ධ සාරාංශය* *viii*

පළමුවන පරිච්ඡේදය - හැඳින්වීම 01

1.1 ප්‍රවේශය 01

1.2 කුත්තු නාට්‍ය පිළිබඳ පර්යේෂණ 03

1. 3 අධ්‍යයනයේ වැදගත්කම 06

1.4 අරමුණු 08

1.5 ක්‍රමවේදය 10

1.6 අධ්‍යයනයේ සීමාවන් 12

දෙවන පරිච්ඡේදය - සබරගමුවේ වතු ද්‍රවිඩ ජනතාව 14

2.1 සබරගමුව හැඳින්වීම 14

2.2 සබරගමුවේ වතු ද්‍රවිඩ ජනතාව ගේ සමාජයීය පසුබිම 15

2.2.1 සබරගමුවේ වතු ද්‍රවිඩ ජනතාව 15

2.2.2 වතු ද්‍රවිඩ ජනතාව ගේ අධ්‍යාපන තත්වය 16

2.2.3 ජීවන වෘත්තීන් 17

2.2.4 ඇදහිලි හා විශ්වාස 20

2.2.5 ආගමික උත්සව 21

2.2.6 සංස්කෘතික පසුබිම 21

2.3 වතු ද්‍රවිඩ ජනතාව හා ඒ ආශ්‍රිත ව ජීවත්වන සිංහල ගැමි ජනතාව 24

2.3.1 සිංහල හා දෙමළ සම්බන්ධතා 24

තෙවන පරිච්ඡේදය - කාමන් කුත්තු උත්පත්තිය හා විකාශනය 26

3.1 ලංකාවේ පවතින කුත්තු නාට්‍ය සම්ප්‍රදායයන් ............ 26

3.1.1 වසන්තන් කුත්තු ............ 27

3.1.2 කාන්තවරායන් කුත්තු ............ 28

3.1.3 පරෛරමේලක්කුත්තු ............ 29

3.1.4 මහඩි කුත්තු ............ 30

3.1.5 වඩමෝඩි කුත්තු ............ 31

3.1.6 තෙන්මෝඩි කුත්තු ............ 32

3.1.7 වඩපාංග හා තෙන්පාංග ............ 33

3.2 කාමන් කුත්තු හැඳින්වීම ............ 35

3.2.1 කාමන් උත්පත්තිය ............ 35

3.2.2 කාමන් කුත්තු කතාව ............ 37

සිව්වන පරිච්ඡේදය - කාමන් කුත්තු රංග වින්‍යාසය 39

4.1 කාමන් කුත්තු සංදර්ශනය ............ 39

4.1.1 කප් සිටුවීම හා සංවිධානය කිරීම ............ 40

4.1.2 රංගන ශිල්පීන් තෝරා ගැනීම හා පුහුණුව ............ 43

4.1.3 චරිත ............ 44

4.1.4 වේදිකාව ............ 46

4.1.5 ඇඳුම් පැළඳුම් හා වෙස් ගැන්වීම් ............ 47

4.1.6 සංගීතය ............ 48

4.1.7 රංග භාණ්ඩ ............ 49

4.2 නාට්‍යමය පෙළපාලි ............ 50

4.3 මළවුන්ගෙන් නැගිටීම ............ 55

4.4 කාමන් කුත්තු සංදර්ශනයෙහි විශේෂතා ............ 55

4.5 අභිචාර විධි හා පූජාකර්ම ............ 56

පස්වන පරිච්ඡේදය - කාමන් කූත්තුව හා වෙනත් කලාවන්ගේ ප්‍රවේශය ........ 59

5.1 ඉන්දීය නැටුම් හා නාට්‍ය සම්ප්‍රදායයන්ගේ ආභාසය ........ 60

5.1.1 නාට්‍ය ශෛලීන් ........ 60

5.1.2 නර්තන ශෛලීන් ........ 61

5.2 දේශීය නාට්‍ය කලාවන් හා සම්බන්ධතා ........ 63

හයවන පරිච්ඡේදය - සමාලෝචනය 68

ආශ්‍රිත ග්‍රන්ථාවලිය 70

සඟරා ........ 72

BIBLIOGRAPHY ........ 73

ශබ්දකෝෂ සහ විශ්වකෝෂ ........ 75

අමුද්‍රිත ලේඛන ........ 75

සිදු කළ සාකච්ඡා ........ 76

උපග්‍රන්ථය 1- දෘශ්‍ය පටය 78

උපග්‍රන්ථය 2 - ඡායාරූප පන්තිය 79

# ඡායාරූපාවලිය


| | | |
|---|---|---|
| i. | අලංකාරව සැරසූ කප් සිටවූ ස්ථානය | 79 |
| ii. | නේපථ්‍යාගාරය | 79 |
| iii. | රංගනය ආරම්භයට පෙර ශිල්පීන්ගේ වස්දොස් දුරු කිරීම | 80 |
| iv. | දේව චරිත පෙරහරින් කැඳවාගෙන ඒම | 80 |
| v. | රදී හා මන්මදන් ලෙස රඟන තාවකාලික නළුවන් දෙදෙනා | 81 |
| vi. | නළු නිළියන්ට සෙත් පැතීම | 81 |
| vii. | රදී, මන්මදන් හා කෝලමා ගේ රංගනයක් | 82 |
| viii. | ප්‍රධාන නළු නිළි දෙපළ වියන යටින් කැඳවාගෙන පැමිණීම | 82 |
| ix. | භාරහාර ඉටු කිරීම සඳහා පූජා භාණ්ඩ රැගත් කාන්තාවන්ගේ පෙරහැර | 83 |
| x. | රංගන ශිල්පීන්ට සෙත්පතා කරන ආශිර්වාද පූජාව | 83 |
| xi. | රදී සහ මන්මදන් අතර විවාහය | 84 |
| xii. | ඊශ්වර දෙවියන්ගේ මුරකරු වන නන්දීශ්වර | 84 |
| xiii. | ශිව දෙවියන් තපසට යාම | 85 |
| xiv. | ශිව දෙවියන් මහාමේරුවට නැගීම | 85 |
| xv. | රදී හා මන්මද කළහා කිරීම | 86 |
| xvi. | ආවේශයට පත්වූවන්ට ආරක්ෂාව සැලසීම | 86 |
| xvii. | හනුමන් හා සාස්තරකාරියගේ පැමිණීම | 87 |
| xviii. | සාස්තරකාරියගේ විචිත්‍රවත් නර්තනය | 87 |
| xix. | මහා කාලියගේ පැමිණීම | 88 |
| xx. | කැත්තක් අතින් ගත් තක්කන්ගේ පැමිණීම | 88 |
| xxi. | කුකුළෙකු අතින් ගත් රුද්‍ර කාලියගේ පැමිණීම | 89 |
| xxii. | කාලියගේ බියකරු වේශයක් | 89 |
| xxiii. | රදී හා මන්මදගේ රුව රැගත් පුවරුව | 90 |
| xxiv. | කප පිළිස්සීමට සූදානම් වීම | 90 |

| | | |
|---|---|---|
| xxv. | ශිව දෙවියන්ගේ තෙවන ඇසින් ආ ගිනිදළු | 91 |
| xxvi. | කප පිළිස්සීම | 91 |
| xxvii. | වීරපත්තිරන් දූතයාගේ පැමිණීම | 92 |
| xxviii. | රිදී වැලපෙමින් ගම වටේ ගමන් කිරීම | 92 |

# උපකාරානුස්මෘති

දීර්ඝ කාලීන උත්සාහයක අවසන් අදියරට ළඟා වී ඇති මොහොතක මෙම ව්‍යායාමය සඳහා මා සමග එක්ව ගමන් කළ සුධීන්ව මතකයට නැංවීම යුතුකමක් කොට සිතමි. අධ්‍යයනය ආරම්භයේ සිට පැවති ගැටලුකාරී තත්වයන් මැද, මා කෙරෙහි අනුකම්පාවෙන් මෙම අධ්‍යයනයෙහි උපදේශකත්වය බාරගෙන, එය නිසියාකාරව ඉටුකර, මා'තින් සිදුවන වැරදි ඉවසා නිවැරදි මගපෙන්වීමක් කළෝ; ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනිල් ආරියරත්න ඇදුරුතුමාණෝය.

හරි දේ හරි ලෙසත්, වැරදි දේ වැරදි ලෙසත් දකින්නට දෑස විවර කළෝ; මානව ශාස්ත්‍ර අධ්‍යයන මණ්ඩල සභාපති, මහාචාර්ය ඥානදාස පෙරේරා ඇදුරිඳුන් ය. අගනා උපදෙස් හා අවවාද දෙමින් අධ්‍යයනය නිවැරදි දිශාවකට ගෙනයන්නට සහාය වූවෝ; සිංහල අධ්‍යයනාංශාධිපති, ආචාර්ය කිවුලේගෙදර නාරද හිමිපාණෝ ය. ආරම්භයේ සිටම කාලයෙන් කාලයට මේ දේ කළ යුතු යැයි පවසමින්, මවක සේ ළඟින් සිට ධෛර්ය දුන්නෝ; ජ්‍යෙෂ්ඨ කථිකාචාරිනී කුසුමලතා ලංකාමුල්ල මහත්මීහු ය.

නිසි කලට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පශ්චාද් උපාධි පීඨයේ පීඨාධිපතිනිය ඇතුළු කාර්ය මණ්ඩලය දුන් සහායට තුති පිදිය යුතු ය. විශේෂයෙන් අපව සම්බන්ධීකරණය කරමින් මහේෂ් මහත්මා කළ උපකාර සිහිපත් කළ යුතුම ය. මේ සමගම තොරතුරු සොයා යාමේදී ශ්‍රී ජයවර්ධනපුර හා රජරට විශ්වවිද්‍යාලයීය පුස්තකාලයන්ගෙන් ලද සහායට එහි පුස්තකාලයාධිපතින් ඇතුළු කාර්ය මණ්ඩලය ද සිහිපත් කරමි.

කාලයක් තිස්සේ අපේ ගම් ආශ්‍රිතව අප සමග වාසය කරන වතු ද්‍රවිඩ ජනයා මෙම අධ්‍යයනයට මූලික සංකල්පය දැමුවෝ වෙති. ද්‍රවිඩ සංස්කෘතියේ විචිත්‍රවත් අංග දන්නා තරමින් විවරණය කරමින් අප හා පවසන ඔවුහු, ඒ නිසා ම මෙහි වැඩි දායකත්වයක් දැක්වූවෝ වෙති. එතැන් පටන් ආගන්තුක සත්කාරය ද, මාර්ගෝපදේශනය ද මේ යැයි පවසමින්, තමන්ගේ සංස්කෘතියේ තොරතුරු මෙන්ම පූජා අවස්ථා, රංගන අවස්ථා පිළිබඳව උනන්දුවක් දැක්වීමේ සැක නුමුසු උද්‍යෝගයකින් සියල්ල හෙළි කළෝ; මෙම වතු ද්‍රවිඩ පූජකවරු හා කම්කරුවෝ ය.

ඒ එළිවනතුරා නිදිවරමින් නාට්‍ය දර්ශන රූප පටයකට ගෙන දුන්නේ 'සළරු' වීඩියෝ ආයතනයයි.

දුර බැහැර සිටිමින්, දුක සැප බලන්න ට දරුවන් නාවත්, කිසි දිනක දොසක් නුදුටු දයාබර තාත්තාටත්, "සක්විති වෙයන්" යැයි කියමින් අයනු ආයනු කියූදා සිට, පපුතුරේ සඟවාගෙන දෑස මෙන් රකිමින්, මා පසුපසින් සියලු දුක් දරා පැමිණි, ආදරණීය අම්මාටත් මෙය මහත් සොම්නසක් බව දන්නෙමි. මෙහි මුල් බරපැන දරන්නට ඉදිරිපත්වූ, එමෙන්ම පසු ගමන් පැමිණි දෙවන මවුන් නොවන්නට, මෙබඳු අදහසක් පල නොදරන්නට ඉඩ තිබිණි.

තනි හිතින් සියලු බර තමන්ටම පවරාගෙන පවුලේ වගකීම් වලින් මා නිදහස් කරන අක්කාට, හා සැහැල්ලුවෙන් සියළු දේ දකින අය්යාත්, කියන මොහොතින් අවශ්‍ය දේ ඉටුකරදීමට සහාය වෙන මල්ලීත් සිහිපත් කළ යුතු ය. දරුවාගේ කුදු මහත් කාර්යයන් සිය වගකීම හා යුතුකම සේ සලකා, දරුවාට අඩුවක් නොවන්නට ආදරය දෙන, නැන්දාගේ සහාය මහාමෙරක් තරම් විය. අහිතක් නොසිතා නිවාඩු අනුමත කළ මගේ පාසලේ විදුහල්පතිතුමා ඇතුළු වචනයකින් හෝ උනන්දු කළ හිතවත් සහෝදර කැළ මට සහායක් වුහ.

ම'පුතු තිසෙව් විඩා දැනෙන හැම මොහොතම සුරතල් වදන්වලින් මා සුවපත් කළ අතර, මගේ හිසමත පුංචි අත් තබා, හොඳට පාස්වෙන්න !!! යැයි ආශිර්වාද කරන්නට තරම් ලොක්කෙකු විය. ඉඳින් නුඹ නොවන්නට-------? උකටලී වන හැම මොහොතම දොස් කියමින්, මා නිදිවරද්දී සිය කාර්යයක් සේ සලකා මා අසල රැඳෙමින්, පුංචි වරදක් වුව නොවන්නට එක අකුර හෝ නිවැරදි කරමින්, ස්වාමියෙකු සතු වගකීම් හා යුතුකම් සෙනෙහස ට මුසුකළ නුඹ නොවන්නට මේ සියල්ල සිහිනයක් වන්නට ඉඩ තිබුණි.

කී නොකී බොහෝ දේ ඇතත් සියල්ල හදවතෙහි රඳා, උපකාර කළ සියල්ලන්ටම තුති පුදන අතර, 'අධ්‍යාපනයෙන් තොර අනාගතයක් නැතැ'යි මට ඉගැන්වූ, මාගේ ගුරු මැණිවරුන් හා පියවරුන් ආදරයෙන් සමරමි.

සබරගමුවේ වතු ද්‍රවිඩ ජනතාවගේ ජන නාට්‍ය කාමන් කූත්තු

කේ. පී. ප්‍රියංකා කුමුදුනී

**නිබන්ධ සාරාංශය**

පළමුවැනි පරිච්ඡේදයෙන් සබරගමුවේ වතු ද්‍රවිඩ ජනතාව අතර පවතින 'කාමන් කූත්තු' නම් ජනනාට්‍ය පිළිබඳව හඳුන්වා දෙනු ලැබේ. මේ යටතේ ප්‍රවේශයක් ලෙස මෙම නාට්‍ය පිළිබඳව මෙතෙක් කර ඇති පර්යේෂණ හා අධ්‍යයනයේ ඇති වැදගත්කම අවධාරණය කෙරෙන අතර, අධ්‍යයනය සිදු කිරීමට මුල්වූ අරමුණු හා ඒවා ඉටු කරගැනීම සඳහා අදාළ කරගත් ක්‍රමවේදය මෙන්ම අධ්‍යයනයේ සීමාවන් පිළිබඳව කරුණු දක්වා ඇත.

අධ්‍යයනය සඳහා පදනම් වූ වතු ද්‍රවිඩ ජනතාව සඳහා දෙවන පරිච්ඡේදය වෙන්කර තිබේ. මෙම ජනයාගේ සමාජයීය, ආර්ථික, ආගමික, පසුබිම මෙන්ම වතු ආශ්‍රිත සිංහල ජනතාව හා ඔවුන් අතර පවතින සහජීවනය පිළිබඳව නොදැන කාමන් කූත්තුවල සැබෑ ස්වරූපය ඉස්මතු කිරීම දුෂ්කර ය. මෙම පසුබිම මූලික වශයෙන් සාකච්ඡා වේ. දීර්ඝ කාලයක් තිස්සේ දේශපාලන, ආර්ථික, ආගමික මෙන්ම වාර්ගික අර්බුදයන් හමුවේ ඒ මේ අත දෝලනය වෙමින් සිය පැවැත්ම තහවුරු කරගැනීමේ අරගලයක යෙදෙන වතු ද්‍රවිඩ ජනතාවගේ සමාජයීය පරිසරය වටහා ගැනීම අධ්‍යයනයේ මුඛ්‍ය පරමාර්ථයට මනා පිටුවහලක් වේ.

තෙවන පරිච්ඡේදය වෙන්කොට ඇත්තේ කාමන් උත්පත්තිය හා විකාශනය පිළිබඳව කරුණු සාකච්ඡා කිරීමට ය. මෙහිදී කාමන් කූත්තු හා බැඳුණු දේව කතා හා සාහිත්‍යගත පුවත් පිළිබඳව විමසන අතර, ලංකාව පුරා රඟ දැක්වෙන විවිධාකාර කූත්තු සම්ප්‍රදායයන් හඳුන්වා දීම ද සිදු කෙරේ. මෙම කූත්තු සම්ප්‍රදායයන් හා කාමන් කූත්තුවෙහි සම්බන්ධය මෙයින් විවරණය කෙරේ.

කාමන් කූත්තු රංග වින්‍යාසය දැක්වෙන්නේ සිව්වන පරිච්ඡේදයෙනි. කප් සිටුවීමේ සිට, නාට්‍ය රංගගත කිරීමේදී ඇතුළත් වන චරිත, වේදිකාව, ඇඳුම් පැළඳුම්, වේශ නිරූපණ සංගීතය, රංගභාණ්ඩ ආදී අවශේෂ සියලුම අංගෝපාංග කාමන් රංගගත වන අවස්ථාවේදී එය

ට යොදාගන්නේ කිනම් අයුරකින් දැයි මෙහිදී සාකච්ඡා කෙරේ. එමෙන්ම මෙම අංග විශේෂිත වන්නේ කවර ලෙසකින් දැයි විමසා බලනු ලැබේ. කාමන් සංදර්ශනයෙහි පවතින අභිචාරාර්ථ පුදපූජා හා එයටම විශේෂිත වූ නාට්‍ය අංග මේ තුළින් සවිස්තරව දැක්වේ.

පස්වන පරිච්ඡේදයෙන් විස්තර වන්නේ කාමන් කූත්තු හා බැඳුණු දකුණු ඉන්දියානු හා දේශීය කලාවන්ගේ ප්‍රවේශය පිළිබඳවයි. දකුණු ඉන්දීය ගැමි නාටක ඇසුරින් ප්‍රභවය වූයේ ද යන්න විමසා බැලෙන අතර, එම ශාස්ත්‍රීය නර්තන අංග හා බැඳුණු සාම්‍යත්වය මෙන්ම ශ්‍රී ලාංකීය ගැමි නාටකයන්ට ඇති ඥාතිත්වය හා සමානතා පිළිබඳව තුලනාත්මකව විග්‍රහ කෙරේ.

මෙම සියලු කාරණා පිළිබඳව එක්ව ගොනුකළ හැකි කරුණු අවධාරණය කරමින්, හය වන පරිච්ඡේදයෙන් ඉහත සාකච්ඡා කෙරුණු තොරතුරු සමාලෝචනය කෙරේ. මෙහිදී කූත්තු නාට්‍යයන්හි එදාමෙදාතුර සිදුවූ පරිවර්තනයන් මෙන්ම කූත්තුවල වර්තමානය හා අනාගතය ද විචාරයට හසුවන කරුණු අතර වේ. කූත්තු නාට්‍ය ඇසුරින් ද්‍රවිඩ නාට්‍යය ලද ආභාසයන් ද සැලකිල්ලට ගෙන කාමන් කූත්තුව පිළිබඳව සැබෑ ස්වරූපය විවරණය කිරීමට මෙම පරිච්ඡේදය වෙන් කෙරේ.

# පළමුවන පරිච්ඡේදය

# හැඳින්වීම

## 1.1 ප්‍රවේශය

ශ්‍රී ලංකාවේ වතුකරයේ ජීවත්වන ද්‍රවිඩ ජනතාවගේ ජීවිතයේ ඉතා වැදගත් අංගයක් නියෝජනය කරන, ඉතා ප්‍රබල ජනකලා විශේෂයක් වශයෙන් 'කාමන් කූත්තු' නාට්‍ය දැක්විය හැකි ය. දීර්ඝ කාලයක් තිස්සේ වතු ද්‍රවිඩ ජනතාව විසින් දුක් කරදර විඳ දරා ගනිමින් ඉමහත් කැපවීමකින් යුතුව ආරක්ෂා කරගෙන එන ලද හෙයින්, අද ද යම් තරමකින් ශේෂ ව පවතින 'කාමන් කූත්තු' **කාමන් උත්සවය** නම් ඔවුන්ගේ පූජා කර්ම ආශ්‍රිත ජන නාට්‍යයක් ලෙස හඳුන්වාදිය හැකි ය. පූජා කර්ම ආශ්‍රිතව බිහිවුන ද නාට්‍ය අංග ඉස්මතුව පෙනෙන, ඉතා විචිත්‍ර හා කලාත්මක අංශයෙන් කැපී පෙනෙන නාට්‍යයක් ලෙස මෙය දැක්විය හැකිවේ. මෙම නාට්‍ය මේ වන විට ඉතා ශීඝ්‍රාකාරයෙන් පරිහානිය කරා යාම දක්නට ලැබෙන බැවින්, ද්‍රවිඩ ජනතාවගේ වැදගත් සංස්කෘතිකාංගයක් ලෙස විමසා බැලීම වටී.

දකුණු ඉන්දීය කම්කරුවන් විසින් රැගෙන එන්නට ඇතැයි සැලකෙන ජන නාට්‍ය විශේෂ අතර 'කාමන් කූත්තුව' වතු ද්‍රවිඩ ජනයා අතර තවමත් ශේෂව පවතී. ශතවර්ෂ ගණනාවක් තිස්සේ විකාශනය වෙමින් වෙනස් වූ සම්ප්‍රදායයන් ඔස්සේ වැඩුණු කූත්තු සම්ප්‍රදායයන් දකුණු ඉන්දියාවේ මෙන්ම ලංකාවේ උතුරු, නැගෙනහිර හා මධ්‍යම, සබරගමු යන පළාත්වල විවිධ වූ ස්වරූපයන්ගෙන් දැකිය හැකි ය. නාට්‍ය කලාවන්ගේ ආරම්භය සමග පුද පූජා හා වත් පිළිවෙත් බැඳී තිබීම දක්නට ලැබෙන අනිවාර්ය ලක්ෂණයකි. කූත්තු සම්ප්‍රදායයන් ද දහස් ගණනක් වූ හින්දු දෙවිවරුන් ට පුද පූජා සිදු කරන වත් පිළිවෙත්වල ස්වරූපයෙන් ඇරඹී, එසේම සෙසු වර්ධිත සම්භාව්‍ය නාට්‍යයන්ගේ ද සම්මිශ්‍රණයෙන් අද වන විට සකස් වී ඇත.

ඉන්දියාවේ කේරළයේ යක්ෂගාන කූත්තු ලෙස ද, තමිල්නාඩුවේ තෙරුක්කූත්තු ලෙස ද රඟ දැක්වුණු කූත්තු සම්ප්‍රදායයන් ලංකාවේ විවිධාකාර ස්වරූපයන්ගෙන් පැතිරී ගොස් ඇත.

'නාට්ටුක්කූත්තු' ලෙස හැඳින්වුණු මෙම නාට්‍ය විවිධ විෂමතා සහිතව වඩමෝඩි, තෙන්මෝඩි, වඩපාංග, තෙන්පාංග, කෝවලන්, කාමන්, මහඩි, වසන්තන් කූත්තු ආදි වශයෙන් විකාශනය වී යම් යම් ප්‍රදේශවල රඟ දැක්වේ. ඉන්දියානු කූත්තු සම්ප්‍රදායයන්වල දැකිය නොහැකි විවිධාංග සමග විටෙක පරිහානියට යමින් ද, අලුත් අලුත් අංග එකතු වෙමින් ද, ස්වාධීන වෙමින් ද, යම් තරමකින් දකුණු ඉන්දීය සම්ප්‍රදායයන් නොනැසී තබා ගනිමින් ද රඟ දැක්වෙන කූත්තුව 'කාමන් කූත්තුව' බව දැකිය හැකි ය. අනෙකුත් නාට්‍ය වර්තමානයේ ලංකාවේ පැවතිය ද අන් නාට්‍යයන්ගේ ලක්ෂණ රැසක් ද උකහා ගෙන නවතාවයක් ගෙන ඇත.

ලංකාවේ දැකිය හැකි නාට්ටුක්කූත්තු සම්ප්‍රදායයන් අධ්‍යයනය කිරීමේදී අපට දැකිය හැකි වැදගත් ලක්ෂණයක් වන්නේ ශාන්තිකර්ම මූලය කොටගෙන ඇරඹී, විවිධ අවධි පසු කරමින් සංවිධිත නාට්‍ය ක්‍රමයක් දක්වා පැමිණ, අද වනවිට ඉතිරිව පවතින අතළොස්සක් පමණ වන දෙමළ ජන නාටක අතරට හුදු ශාන්තිකර්මයක් ලෙස දැක්වෙන කාමන් කූත්තුව වතුකර ද්‍රවිඩ ජනයා අතර තවමත් පවතින බවයි.

ඉන්දීය කම්කරුවන් විසින් 18 හා 19 වන සියවස් වලදී මෙරටට ගෙනඑන ලදැයි කියවෙන ජන නාට්‍යයක් ලෙස කාමන් කූත්තුව දැක්විය හැකි ය. ලංකාවේ නිරිතදිගට වන්නට පිහිටා ඇති සබරගමුව පළාත ට අයිති කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්ක තුළ පුළුල් ලෙස ව්‍යාප්තව සිටින වතු ද්‍රවිඩ ජන සමූහය තදනුබද්ධ ප්‍රදේශයන්හි සිංහල ජනයා හා එක්ව ජීවත්වන්නට පටන් ගැනීමත් සමග කාමන් කූත්තු සබරගමුව තුළ ජනප්‍රිය කලාංගයක් ලෙස පැතිර ගොස් ඇත. සබරගමුවේ හින්දු කෝවිල්වල කෝවිල් උත්සවය හෙවත් 'තිරුවිලා' ආශ්‍රිත ව වර්ධනය වූ කූත්තු නාට්‍ය සම්ප්‍රදාය මෙයයි.

'කාමන්' හෙවත් 'මන්මද' විසින් ඊශ්වර දෙවියන්ගේ දියණිය වූ 'රතී' දෙවඟන විවාහ කරගැනීමෙන් පසු කාමන් හා ශිව දෙවියන් අතර ඇතිවන ගැටුම මෙයින් නිරූපණය වේ.